පරිගණකයෙහි ඉතිහාසය

පරිගණකය යනු අද වන විට සෑම ක්ෂේත්‍රයක් තුලම අත්‍යවශ්‍යයම මෙවලමක්වී ඇතිබව නොකිවමනාය. මිනිසා ඈත අතීතයේ සිටම එක් එක් යුග පසු කරනවිට තොරතුරු වල අවශ්‍යතාවය වැඩිවිය. විවිධ දේ සැලසුම්කිරීමට, සංසන්දනය කිරීමට, අනාවැකි ප්‍රකාශ කිරීමට ආදී නොයෙක් දේසඳහා තොරතුරුවල අවශ්‍යතාවය මතුවිය. මිනිසුන්ගෙ මෙකී අවශ්‍යතා නිසා ඈත අතීතයේ සිටම ඊට ගැලපෙන උචිත යන්ත්‍ර සූත්‍ර නිර්මාණය කිරීමට පෙලඹිනි◌ මෙලෙස තොරතුරු නිර්මාණය කිරීමට, ගබඩා කිරීමට,එවා හැසිරවීමට, කළමණාකරණය යනාදී කාර්යයන් ඉටු කිරීම සඳහා බිහිවූ ප්‍රබලතම මෙවලමක් වශයෙන් පරිගණකය හැඳින්විය හැක.පරිගණකය හා බැදුනු තොරතුරු සන්නිවේදන තාක්ෂණය අද වන විට මිනිසාගෙ සෑම ක්ෂේත්‍රයකම සෑම කටයුත්තක් සඳහාම කුමන හෝ ආකාරයෙන් බද්ධවී ඇත. සෞඛ්‍ය ක්ෂේත්‍රයට, අධ්‍යාපන ක්ෂෙ ත්‍රයට,මූල්‍යය ක්ෂේත්‍රයට මෙන්ම මෙකී නොකී සෑම ක්ෂෙ ත්‍රයකටම තොරතුරු තාක්ෂණය බද්ධවී ඇත.අද වන විට නිවසේ මේසයක නැතහොත් උකුල මත තබාගෙන ඉතාපහසුවෙන් භාවිතා කරනු ලබන පරිගණකය මේ තත් වයට ගෙන එමට අතීතයේ නොයෙක් විද්‍යාඥයින් විසින් ගත් උත්හාසයක ප්‍රතිඵලයකි◌ විවිධ සොයාගැනීම් හා අත්වැරදීම් දහස් ගණන් තුලින් ගත් උත්සාහයන් තුලින්මේ තරමට කුඩාවට සැහැල්ලුවට පරිගණකය නිර්මාණය කිරීමට බෙහෙවින් ඉවහල්විය. එමෙන්ම මේ තත්වය දක්වා ගෙන එමට දශක පහක පමණකාලයක් ගතවු බවද සිහිපත් කල යුතු වෙයි◌ ඉතා ඈත අතීතයේ සිටම මිනිසා තම කාර්යයන් පහසු කරගැනීම සඳහා මෙවලම් භාවිතයට හුරුවිය. මේ අනුව ගණන් කිරීමට එනම් ගණිතමය කටයුතු පහසු කරගැනීම සඳහා ඇබකසය නම් උපකරණය භාවිතාකරනලදී. අද අප උකුලේ තබාගෙන පරිහරණය කරන මෙම පරිගණකයට මූලික අඩිතාලම වශයෙන් ඇබකසය හැඳින්විය හැක.

ගණිත කර්ම සඳහා මුලින්ම භාවිතා කරන ලද උපකරණ අතරට ඇබකසය ගැනෙන අතර මෙය විවිධ ජාතීන් විසින් භාවිතා කරනලද අතර ආසියාතික රටවල මෙන්ම උතුරු ඇමරිකානු රට වලදීද මෙය භාවිතා කරන ලදී. මෙය ගණන් කිරීමේදී පහසුවක් ඇතිකරගැනීම සඳහා භාවිතා කරනලද උපකරණයක් වශයෙන්හැඳින්විය හැක

